079

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය.
පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා වැඩ සටහන

අවසාන පරීක්ෂණය (දෙවන අධ්‍යයන වාරය) - 2006/2007

**ESP 1107 - විෂයමාලා න්‍යාය හා පරිචය**

**කාලය පැය තුනයි.**

---

දිනය - 2007.12.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

I කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II වන කොටසින් කැමති ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. "සාමාන්‍ය අධ්‍යාපන ව්‍යවහාරයේදී විෂයමාලාව යන සංකල්පය සාමාන්‍යයෙන් පෙළ පොත්, පාඨ ග්‍රන්ථ හෝ පාසලේ උගන්වනු ලබන පාඨමාලාවන් හා සම්බන්ධව පවතී. වෘත්තීය අධ්‍යාපනඥයන් සාමාන්‍යයෙන් මෙම සංකල්පය පුළුල්ව විග්‍රහ කොට ඇත."

    ඉහත ප්‍රකාශය ඔබ අධ්‍යයනය කළ විෂයමාලා නිර්වචන සැලකිල්ලට ගෙන විස්තර කරන්න.

02. "විෂයමාලාව කාලානුරූපීව වෙනස් වේ. " එයට හේතු 4 ක් ඉදිරිපත් කරන්න.

03. ශ්‍රී ලංකාවේ වර්තමාන ද්විතීයික පාසල සඳහා හඳුන්වා දී ඇති 5E ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පියවර 5 නම් කරන්න.

04. හර විෂයමාලාව හා සමෝධානිත විෂයමාලාව අතර වෙනස්කම් දක්වන්න.

05. ආර්.ටයිලර් ඉදිරිපත් කළ විෂයමාලා සංවර්ධන ආකෘතියේ පියවර 4 ලැයිස්තු ගත කරන්න.

06. විෂයමාලාව ඇගයීමට භාවිත කරන CIPP ආකෘතියේ මූලික පියවර නම් කරන්න.

07. විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී ගුරුවරයාගේ කාර්යයන් තුනක් කෙටියෙන් පැහැදිලි කරන්න.

08. සමාන්තරව හා සිරස්ව විෂයමාලාව සමෝධානය කිරීම යන්න විස්තර කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. i. නිපුණතා පාදක විෂයමාලාවක ප්‍රධාන පැතිකඩ 3 ක් විස්තර කරන්න. (ලකුණු 05)

ii. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයා සතු සම්ප්‍රේෂණ, ගණුදෙනු හා පරිනාමන ගුරු භූමිකා අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. ගුරුවරයාට පරිනාමන ගුරු භූමිකාව ක්‍රියාත්මක කිරීම සඳහා ද්වීතියික මට්ටමේ පාසල් විෂයමාලාව කොතෙක් දුරට අදාළ වේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 10)

10. i. විෂයමාලාව ඇගයීමේදී සැලකිල්ලට ගතයුතු ප්‍රධාන සාධක 3 ක් සාකච්ඡා කරන්න. (ලකුණු 05)

ii. විෂයමාලා ඇගයීමේ ආකෘති 3 ක් නම් කරන්න (ලකුණු 05)

iii. ඉහතින් නම් කරන ලද ආකෘති අතුරින් එකක් තෝරාගෙන එහි ඵලදායකත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 10)

11. i. ශ්‍රී ලංකාවේ පාසල් විෂයමාලාව නියමාකාරයෙන් ක්‍රියාත්මක කිරීමට බාධාකාරී සාධක පරීක්ෂා කරන්න. (ලකුණු 10)

ii. ඉහත බාධක ජයගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

12. i. විෂයමාලා සංවර්ධනය යන්න පැහැදිලි කරන්න. (ලකුණු 05)

ii. විෂයමාලාවක පරමාර්ථ හා අරමුණු පැහැදිලි කිරීමෙහි ලා පදනම් වන කරුණු කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. වර්තමාන ශ්‍රී ලංකාවේ ද්වීතියික මට්ටමේ විෂයමාලාවේ පරමාර්ථ හා අරමුණු කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

13. i. විෂයමාලා කළමනාකරණය යන සංකල්පය විග්‍රහ කරන්න. (ලකුණු 05)

ii. විෂයමාලා කළමනාකරණ ක්‍රියාවලියේදී විදුහල්පති භූමිකා පැහැදිලි කරන්න. (ලකුණු 05)

iii. විදුහල්පතිගේ විෂයමාලා කළමනාකරණ ක්‍රියාවලියේදී ගුරුවරයාට උදව් විය හැකි ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 10)

14. පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. 1972 නවමග අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ලක්ෂණ
ii. සන්තතික ඇගයීම හා සම්පිණ්ඩිත ඇගයීම
iii. විෂයමාලාවේ අදාළත්වය
iv. විෂයමාලා සංවර්ධන ක්‍රියාවලියේදී ජාතික අධ්‍යාපන ආයතනය සතු භූමිකාව

(ලකුණු 10 x 2 = 20)

\- හිමිකම් ඇවිරිණි. -